# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ චරිතය

### 02 පාඩම; බුද්ධ කාලීන භාරතීය දේශපාලන පසුබිම

[[ 2024/2025 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති රාජාණ්ඩු හතරෙහි පාලනය මෙහෙයවූ රජවරුන් හතර දෙනෙකු නම් කරන්න.

II එම රාජාණ්ඩු අතර කෝසල ජනපදයෙහි දේශ සීමා හතරක් පෙන්වා දෙන්න.

III රාජාණ්ඩු පාලන ක්‍රමයෙහි මූලික ලක්ෂණ කරුණු තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න.

IV බුද්ධ චරිතයට සම්බන්ධ වැදගත් සිදුවීම් සිදු වූ රාජාණ්ඩු දෙකක් නම් කොට,ඒවායෙහි බුද්ධ චරිතයේ සම්බන්ධතාව සිදුවීම් දෙකක් ඇසුරින් දක්වන්න.

[[ 2019/2020 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයෙහි පැවති සමූහාණ්ඩු හතරක් නම් කරන්න.

II බුද්ධ කාලීනව පැවති සමූහාණ්ඩු පාලනය කළ රාජ වංශ හතරක් ලියා දක්වන්න.

III බුද්ධ චරිතයට සම්බන්ධ වැදගත් සිදුවීම් සිදුවූ සමූහාණ්ඩු දෙකක් නම් කොට එම සමූහාණ්ඩුවලදී ඇතිවූ බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

IV සමූහාණ්ඩුවල ක්‍රියාත්මකව පැවති බුදුරජාණන් වහන්සේගේ ප්‍රශංසාවට ලක් වූ ක්‍රමවත් රාජ්‍ය පාලන ව්‍යවස්ථාවක් කෙටියෙන් හඳුන්වන්න.

[[2018/2019 ]] 06 වන ප්‍රශ්නය

I ‘දකුණු බිහාරය’ නමින් හැඳින්වෙන රාජාණ්ඩු අතුරින් පළමු වැන්නට උතුර,නැගෙනහිර,බටහිර හා නිරිත දිග දේශ සීමා ලියා දක්වන්න.

[[ 2017/2018 ]] 02 වන ප්‍රශ්නය

I මගධ රාජ්‍ය ස්වාභාවිකවම ආරාක්ෂාවී තිබූ පංච මහා පර්වත අතුරින් හතරක් නම් කරන්න.

II රාජාණ්ඩු පාලනයෙහි මූලික බලය හිමිවූ තැනැත්තා හා ඔහුට සාහය වූ මූලික තනතුරු දැරූ තැනැත්තන් තුන් දෙනෙකු නම් කරන්න.

III පාලකයා,අගනගරය,දේශසීමා යන කරුණු ඇතුලත් වන පරිදි මගධ රාජධානිය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

IV රාජ්‍ය පාලකයා සතර කරුණකින් ජනතාවට සංග්‍රහ කළ යුතුය යන්නරාජාණ්ඩු පාලන මූළ ධර්මයකි.මෙහි සඳහන් සතර සංග්‍රහ වස්තුව රාජ්‍ය පාලන මූළධර්මයක් ලෙස විචාරයට ලක් කරන්න.

## [[ 2016/2017 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති රාජාණ්ඩු හතරක් හා ඒවායෙහි රජවරු හතරක් නම් කරන්න.
II පාලකයා සතර අගතියෙන් තොරව පාලන කටයුතු සිදුකළ යුතුය යන්න.රාජාණ්ඩු පාලන බෞද්ධ මූළ ධර්මයකි.මෙහි සඳහන් සතර අගති ලියා දක්වන්න.
III එකළ ලිච්ඡවීන් පාලනය කළ වේශාලියෙහි පැවති රාජ්‍ය පාලන ව්‍යවශ්ථා මාලාවක් වූ සප්ත අපරිහානීය ධරම රාජ්‍ය පාලන මූළ ධර්මයක් ලෙස සැළකිය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
IV දැහැමි රාජ්‍යක් උදෙසා රාජ්‍ය පාලකයාගේ වගකීම කවරේදැයි බෞද්ධ දේශපාලන මූළධර්ම ඇසුරෙන් සාකච්ඡා කරන්න.

## [[ 2015/2016 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති සොළොස්මහා ජනපද අතුරින් හතරක් නම් කරන්න.
II එකල පැවති ඒ ඒ රාජවංශ විසින් පාලනය කරන ලද සමූහාණ්ඩු හතරක් නම් කරන්න.
III බුද්ධ කාලීනව පැවති රාජාණ්ඩු අතර කෝසල රාජධානිය පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න.
IV රාජ්‍ය පාලනයෙහිලා බුදුසමයේ මග පෙන්වීම පැහැදිලි කරන්න.

## [[ 2013/2014 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධකාලීන භාරතයේ පැවති පාලන ක්‍රම නම් කරන්න.
II එකල පැවති රාජාණ්ඩු හතරක් නම් කරන්න.
III රාජාණ්ඩු අතර මගධ රාජධානිය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.
IV බුද්ධ කාලීනව පැවති සමූහාණ්ඩු නම් කොට ලිච්ඡවීන් අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්ම රාජ්‍ය පාලනයෙහි වැදගත්වන අයුරු පෙන්වා දෙන්න.

## [[ 2010/2011 ]] 03 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ භාරතයෙහි පහළවූයේ ක්‍රි.පූ කීවෙනි ශතවර්ෂය තුළද?
II සිදුහත් කුමරු ජන්මලාභය ලැබුවේ කිනම් රාජ්‍යක,කිනම් ජනපදයක,කිනම් නුවරක,කිනම් උයනකදීද?
III බුදුරදුන් ලොව පහළවන සමයෙහි භාරතයෙහි පැවති ප්‍රධාන රාජාණ්ඩු හතර නම් කර,සැකෙවින් හඳුන්වා බුදුරදුන් හා එම රාජධානි අතර පැවති සබඳතා ගැන විස්තර කරන්න.

IV ශාක්‍ය,කෝලියා යුද්ධය,චූලෝදර-මහෝදර යුද්ධය වැනි බුදුරදුන් මැදිහත්වූ රාජ්‍යතාන්ත්‍රික ගැටළු පිළිබඳ විස්තරයක් සපයා බුදුහිමියන්ගේ මැදිහත්වීමෙන් ඒවාට සැලසුණු යහපත පැහැදිලි කරන්න.

## [[ 2008/2009 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලයේ මහා ජනපද කීයක් පැවතියේදැයි දක්වා,ඉන් හතරක් නම් කරන්න.

II ශාක්‍ය කෝලීය ජනපද කිනම් රාජ්‍යයන්ට අයත්ද?කවර නදියක් දෙපස පිහිටියේද? ඒවායේ ප්‍රධාන නගර කවරේද?

III සප්ත අපරිහානීය ධර්ම ලියා ඒවා යහපත් පාලනයකට පදනම වන ආකාරය විමසන්න.

IV බුද්ධකාලීන භාරතයේ දේශපාලන පසුබිම පිළිබඳ කෙටි සටහනක් දක්වා බුදුසමයේ ව්‍යාප්තියට එම පසුබිම උපකාරවූ ආකාරය විමසන්න.

## [[ 2007/2008 ]] 02 වන ප්‍රශ්නය

I රාජ්‍යත්වය,ග්‍රාමභෝජක,ගාමිණී,නගරගුත්තික ආදීන් යටතේවූ ප්‍රාදේශීය පාලනය හමුදා ශක්තිය,නීතියේ ස්වාභාවය,දඬුවම් හා රාජ්‍ය ආර්ථිකය යන ශීර්ෂ ඔස්සේ භාරතයේ පැවති රාජාණ්ඩු ක්‍රමය පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

II බුදුන් වහන්සේගේ චරිතය හා කෝසල රාජ්‍ය අතර තිබූ සබඳතා පැහැදිලි කරන්න.

III බුද්ධ කාලීන භාරතයේ දේශීය හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විස්තරයක් කරන්න.

IV බුද්ධ කාලීන භාරතයේ පරිපාලන ප්‍රතිපත්ති සැකෙවින් දක්වා ඒවා ඇගයීමට ලක් කරන්න.

## [[ 2006/2007 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලයේ පැවති ප්‍රධාන ආණ්ඩු ක්‍රම දෙකක් නම් කර, ශාක්‍ය,ලිච්ඡවී,කාලාම හා මල්ලයන් පාලනය වූයේ කවර ආණ්ඩුක්‍රම යටතේදැයි නම් කරන්න.

II ලිච්ඡවී පාලනයේදී අනුගමනය කෙරුණු මූලික ව්‍යවස්ථා හත නම් කර රාජ්‍ය පාලනයේදී ඒවායේ තිබෙන අගය පැහැදිලි කරන්න.

III සොළොස් මහා ජනපද නම් කර වත්ස්‍ය රාජ්‍ය පිළිබඳ විස්තරයක් කරන්න.

## [[[ 2005 ]]] 02 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ පහළවන සමයෙහි භාරතයේ පැවති ප්‍රධාන රාජාණ්ඩු හතරක් නම් කර එක් එක් රාජ්‍යයේ අගනුවර හා අධිපතියා නම් කරන්න.

II බුද්ධකාලීන භාරතයෙහි සමූහාණ්ඩු පාලන ක්‍රමය භාවිතා කළ රාජ වංශ නම් කර එක් එක් රාජවංශය අගනුවර ලෙස භාවිතා කළ නගර නම් කරන්න.

III ලිච්ඡවීන්ගේ සමූහාණ්ඩුවෙහි මූලික ව්‍යවස්ථා හතක් ක්‍රියාත්මක වූ බව සඳහන් වේ. සප්තාපරිහානීය ධර්ම නමින් හැඳින්වුණුඑම ව්‍යවශ්ථා හත නම් කර,රාජ්‍යක අභිවෘද්ධිය සඳහා මේ එක් එක් ව්‍යවශ්ථා පාදක වන ආකාරය පැහැදිලි කරන්න.

## [[[ 2004 ]]] 02 වන ප්‍රශ්නය

I සප්ත අපරිහානීය ධර්ම සඳහන් කරන්න.

II සප්ත අපරිහානීය ධර්ම ක්‍රියාත්මක නොවන රාජ්‍යයක් කෙබඳු විය හැකිදැයි සාකච්ඡා කරන්න.

## [[[ 2002 ]]] 01 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන සමූහාණ්ඩු පාලනයේ ක්‍රියාත්මකවූ සප්ත අපරිහානීය ධර්ම සඳහන් කරන්න.

II බුද්ධ කාලීන මගධ රාජ්‍යය ආශ්‍රයෙන් රාජාණ්ඩු ක්‍රමයේ ස්වරූපය විස්තර කරන්න.

## [[[ 2000 ]]] 01 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ සොළොස් මහා ජනපද නම් කර ඒවායින් පහක ප්‍රධාන නගර සඳහන් කරන්න.

II රාජාණ්ඩුවක පරිපාලන ව්‍යුහය ක්‍රියාත්මක වූ අයුරු විස්තර කරන්න.

## [[[ 1999 ]]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ සිවු මහා ජනපද කවරේද?

II සිවු මහා ජනපද අතර පැවති දේශපාලනික සබඳතා අනාවරණය කරන්න.

## [[[ 1997 ]]] 03 වන ප්‍රශ්නය

බුදු දහමේ ව්‍යාප්තිය සඳහා ක්ෂත්‍රීය වර්ණයෙන් සිදුවූ මෙහෙය අගය කරන්න..........